(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 94.]

පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2021 සැප්තැම්බර් 21 අඟහරුවාදා පූ.භා. 10.00 ට

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

72/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගි වූ පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් නියෝජිතයාගේ නම හා අදාළ පළාත් පාලන ආයතනයේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් වැඩමුළුව පැවති රට, නගරය හා කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වැඩමුළුවට සහභාගි වීම සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කළ පළාත් පාලන ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

176/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාලු පාරේ කොළඹ සිට මොරටුව දක්වා පවතින අධික මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් සිදු කරනු ලබන මුහුදුබඩ මාර්ගයේ (Marine Drive) ඉදිකිරීම් කටයුතු, කොල්ලුපිටියේ සිට දෙහිවල - වාසල පාර දක්වා පමණක් සිදු කර ඇති බවත්;

(ii) එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමී බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමිවන්නන් සඳහා ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(ii) වන්දි මුදල් ලබා දීමට තවදුරටත් ඉතිරිව තිබේ නම්, එම මුදල් ලබා දීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

178/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි තැපැල් සහ උප තැපැල් කාර්යාල වර්ග කිරීම අනුව නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ පිහිටි තැපැල් සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ස්ථිර ඉඩම් සහ ගොඩනැගිලි සහිත තැපැල් සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරදිපුරම්, පුන්නෛනීරාවි, පල්ලික්කුඩා ප්‍රදේශයන්හි උප තැපැල් කාර්යාල ඉදිකිරීමට අවශ්‍ය බව දන්නේද;

(ii) එසේ නම්, 2016.09.05 දින එවකට අමාත්‍යවරයාට මවිසින් යොමු කළ ලිපිය අනුව, තැපැල්පතිවරයා වෙත යොමු කරන ලද අංක PPS&MR/HR/09-182 හා 2016.09.09 දිනැති ලිපියට පියවරක් නොගත්තේ මන්ද;

(iii) කල්මඩුනගර්, තිරුනගර්, කෝනාවි, කරඩිබෝක්කු, තිරුවෛයාරු, අම්බාල්කුලම්, මුරසුමෝට්ටෛ, දරුම්පුරම්, කණ්ඩාවලෛ, පුළියම්පොක්කනෛ, කුංජුපරන්දන්, සිවනගර්, මුහමාලෛ, ඉයක්කච්චි, කිළාලි, එලුදුමට්ටුවාල්, සෝරන්පට්ටු, තට්ටුවන්කොට්ටි, සුණ්ඩික්කුළම්, සෙට්ටියකුරුච්චි, ඉරනෛතීවු, ගෞදාරිමුනෛ, පල්ලවරායන්කට්ටු, නල්ලූර්, කිරාංජි හා වේරවිල් යන උප තැපැල් කාර්යාලවලට ස්ථිර ගොඩනැගිලි පහසුකම් ලබාදෙන දිනය කවරේද;

(iv) දිස්ත්‍රික්කයේ, ප්‍රධාන තැපැල් කාර්යාල හතර වන කිළිනොච්චි, පරන්තන්, පච්චිලෛපල්ලි හා පූනගරි නවීන පරිගණක පහසුකම් සහිතව ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

4.

293/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අළෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

313/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් ද්‍රෝණිය අසළ විශාල ඛනිජ තෙල් නිධියක් පවතින බවට සනාථ කර ගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) එම නිධිය සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම පර්යේෂණ කිරීම සඳහා භාර දෙන ලද ආයතනවල හා සංවිධානවල නම් කවරේද;

(iv) එම පර්යේෂණ කිරීම සඳහා මේ වනතෙක් වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ඛනිජ තෙල් සහ ගෑස් නිධියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් මේ වනතෙක් අමාත්‍යාංශය විසින් ගනු ලැබූ සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

467/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට එක් වර්ෂයකට ආනයනය කරනු ලබන රසායනික පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වගාබිම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) වගාබිම් හෙක්ටයාර් එකක් සඳහා යොදනු ලබන රසායනික පොහොර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රසායනික පොහොර යෙදීම හේතුවෙන් පසට සිදු වන හානිය සම්බන්ධයෙන් පර්යේෂණ කර තිබේද;

(ii) එම හානිය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

605/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව 2020/2021 මහ කන්නයේ වගා කටයුතු සඳහා රසායනික පොහොර නොමිලේ ලබා දෙන්නේද;

(ii) එසේ නම්, වගා කරනු ලබන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iii) වී වගා කරන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iv) එසේ නම්, වී වගා කරනු ලබන එක් අක්කරයක් සඳහා එක් එක් පොහොර වර්ගවලින් ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අතිරේක බෝග වගා කිරීම සඳහා අක්කරයකට ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

630/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය;

(ii) එම කුඹුරු ඉඩම් අතරින් මේ වනවිට වගා කරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ පුරන් වී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුරන් වී ඇති කුඹුරු ඉඩම් නැවත අස්වැද්දීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

836/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 03, ගාලු පාර, 282/සී දරන ලිපිනයේ පදිංචි කස්තුරිආරච්චිගේ යසසිරි හා ජේ.ජී.අයි. උදයංගනී කස්තුරිආරච්චි යන අයට එරෙහිව රුපියල් 201,337.50/- ක පාරිතෝෂික මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති අංක 90661 දරන නඩුවට අදාළව 2019.08.01 දින අධිකරණයට ඉදිරිපත් නොවීම හේතුවෙන් 2019.08.06 දින ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් විසින් විවෘත වරෙන්තුවක් නිකුත් කර ඇති බවත්;

(ii) වරෙන්තු නිකුත් කර මේ වනවිට වසරකුත් මාස දෙකක් ගතවුවද ඔවුන් අත්අඩංගුවට ගෙන නොමැති බවත්;

(iii) මේ සම්බන්ධව 2020.10.02 දින පැවති විමර්ශනයේදී ඔවුන්ට එරෙහිව පවරා ඇති නඩු 20 කට පමණ සිතාසි හා විවෘත වරෙන්තු නිකුත් කර ඇති අතර අදාළ පොලිස් ස්ථානය විසින් ඔවුන් අත්අඩංගුවට ගත යුතු බව ගාල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා ප්‍රකාශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වෙනත් පාර්ශ්වයක බලපෑමකින් හෝ අතපසුවීමකින් ඔවුන් අත්අඩංගුවට ගැනීමට නොහැකි වී තිබේද;

(ii) එසේ නම්, එකී පාර්ශ්වයන්ට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1736/2021

ගරු තිසකුට්ටි ආරච්චි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවයේ ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා පුද්ගලයකු පත් කරන ලද්දේද;

(ii) එසේ නම්, එම පුද්ගලයාගේ නම, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් කවරේද;

(iii) ඔහු, ස්වාධීන රූපවාහිනී සේවයේ සේවය කරන ලද කාල වකවානුව කවරේද;

(iv) ඔහුට ගෙවන ලද මාසික වැටුප, දීමනා හා ලබා දෙන ලද වෙනත් පහසුකම් කවරේද;

(v) ඒ අනුව සේවය කරන ලද කාලය තුළ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ස්වාධීන රූපවාහිනී සේවයේ සේවය කරන ලද කාල වකවානුව තුළ ඉහත සඳහන් පුද්ගලයාට ගෙවා ඇති ගෙවීම් අයථා ගෙවීම් නම්, එම ගෙවීම්වලට වගකිව යුතු නිලධාරින්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

කම්කරු අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන),— 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන),— 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 (1) හි විධිවිධාන ප්‍රකාරව සහ 2021 සැප්තැම්බර් 17 තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, 2020 සැප්තැම්බර් 08, 2021 ජනවාරි 07 සහ 2021 අගෝස්තු 06 යන දිනයන්හි පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා තිස් එක (31) ට අමතරව සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පත් කළ යුතු ය.

එකී කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර බලා වාර්තා කිරීම සඳහා එකී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් (5) සමන්විත විය යුතුය.

එකී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් (3) සංයුක්ත විය යුතුය.

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් අමාත්‍යතුමා,— සුරාබද්දු ආඥාපනත යටතේ නිවේදනය,— (52 අධිකාරය වන) සුරාබද්දු ආඥාපනතේ 8 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබද්දු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 07/2021 දරන සුරාබද්දු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 1),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 22 දිනැති අංක 2216/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 2),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 09 දිනැති අංක 2218/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 3),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 19 දිනැති අංක 2219/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 4),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 19 දිනැති අංක 2224/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය (අංක 5),— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 (3) වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 13 දිනැති අංක 2223/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 (3) වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 26 දිනැති අංක 2225/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 27 දිනැති අංක 2225/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 27 දිනැති අංක 2225/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 (3) වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 17 දිනැති අංක 2228/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 (3) වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූනි 14 දිනැති අංක 2232/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 1),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 ජූනි 30 දිනැති අංක 2234/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 2),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 ජූනි 30 දිනැති අංක 2234/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග (අංක 3),— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 ජූලි 06 දිනැති අංක 2235/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූලි 02 දිනැති අංක 2234/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූලි 31 දිනැති අංක 2238/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානවල සහ 2021 අප්‍රේල් 05 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව කථානායකවරයා විසින් පත්කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහහත් (17) දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

*19.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා,— වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියෝග,— (469 අධිකාරය වූ) වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වගන්තිය සමඟ කියවිය යුතු 22අ වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අගෝස්තු 19 දිනැති අංක 2241/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝග,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 20 දිනැති අංක 2228/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝග,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ පැවරුම් මිල නියෝග සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 මාර්තු 02 දිනැති අංක 2217/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ නියෝගය,— 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වන වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වන තොරතුරු තාක්ෂණය සහ සඵල සේවා නියම කරමින් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 ජූනි 29 දිනැති අංක 2234/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝගය,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වන තොරතුරු තාක්ෂණය සහ සඵල සේවා නියම කරමින් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 ජූනි 29 දිනැති අංක 2234/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 6(2) වන වගන්තිය යටතේ ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2021 මැයි 10 දිනැති අංක 2227/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14(1)(ඊ) සහ 15 වගන්ති සමඟ කියවිය යුතු 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමණාකරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 53 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 01 දිනැති අංක 2221/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

ඛනිජතෙල් සම්පත් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2021 ජූලි 08) [1].

*32.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඈ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

33.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.